## පරිසරයේ නිර්මිත වස්තු රේඛාවෙන්

පරිසරයේ ප්‍රධාන කොටස් දෙකකි. ස්වභාවික පරිසරය හා නිර්මිත පරිසරය වශයෙනි. නිර්මිත පරිසරය නම් මිනිසා විසින් නිර්මාණය කළ වස්තූන්ගෙන් සැදි පරිසරය යි. එහෙත් පරිසරය අධ්‍යයනයේ දී මේ පරිසර පද්ධති දෙක ම අධ්‍යයනය කළ යුතුය. ඊට හේතුව නිර්මිත පරිසරය හා ස්වභාවික පරිසරය හැමවිට ම වාගේ මිශ්‍රව පැවතීම යි. ස්වභාවික පරිසරය අධ්‍යයනය කිරීම උදෙසා ද ඔබට උපදෙස් ලබා දී ඇත. මෙහි දී අවධානය යොමු කරන්නේ නිර්මිත පරිසරය අධ්‍යයනය කිරීම කෙරෙහි ය.

නිවාස ඇතුළු විවිධ ගොඩනැගිලි, මංමාවත්, රථවාහන, කෘත්‍රිම ජලසම්පාදන හා ජලාපවහන පද්ධති, කුලුනු, සන්නිවේදන පද්ධති ආදී නොයෙකුත් දේ මීට අයත් වේ.

එහෙත් මේ සියල්ල නිර්මාණය කළ මිනිසා ඒ නිර්මිත පරිසරයේ කොටසක් නොවන බව ද මතකයේ තබාගතයුතු ය. ඔහු අයත් වන්නේ ස්වභාවික පරිසරයට ය.

නිර්මිත පරිසරයේ බොහෝ විට දක්නට ලැබෙන්නේ ගෝලාකාර, සිලින්ඩරාකාර හා විශේෂයෙන් ඝණකාකාර හා ඝණකාභාකාර වස්තූන් ය. එවන් හැඩතලයන් ය.

ඇතැම් විට නිවාස වහලය වැනි තැන්වල ප්‍රිස්මාකාර හෝ පිරමීඩාකාර හැඩ දක්නට ලැබේ.අප මේවා පොදුවේ හඳුන්වන්නේ ජ්‍යාමිතික හැඩතල වශයෙනි. නිර්මිත

පරිසරයේ ජ්‍යාමිතික හැඩතල වැඩිය. නිර්මිත පරිසරයේ ඇති වස්තූන් අධ්‍යයනයේ දී අප මූලිකව ම අවබෝධ කරගතයුත්තේ ඒවායේ එම ජ්‍යාමිතික හැඩතලය යි.

කෙසේ වුව ද  ඒවායේ හැඩය නිසි ලෙස මතු වී පෙනෙන්නේ ඒ මත පතිත වන ආලෝකය අනුවය. ආලෝකය පතිත වීම අනුව හැඩය මතු වීම, ත්‍රිමාණ ලක්ෂණ මතු වීම පමණක් නොව ඒවායේ ස්වභාවය ද වෙනස් වී පෙනෙයි. ගුවන්යානයක් කුමන පැහැයෙන් යුතු වුව ද ඈත අහසේ ගිනියම් හිරු එළිය මැදින් ගමන් කරනාවිට එය පෙනෙන්නේ දිදුලන ඇලුමීනියම් පැහැයෙනි. ඔබට ද මේ පිළිබඳ අත්දැකීම් ඇතුවාට සැක නැත.

ආලෝකය තදින් පතිත වන විට සුදුපැහැ බිත්තියක් බබළන ආකාරය පෙනෙයි. ඒ නිසා එහි හැඩය නො පෙනී යයි. ඊට අනුව සිතිය හැක්කේ යම් වස්තුවක නිවැරදි හැඩය මතු වී පෙනෙන්නේ ආලෝකය නිසි පමණට පතිතවන්නේ නම් පමණක් බව ය. මේ නිසා ආලෝකය යනු මෙහි තීරණාත්මක සාධකයකි.

මේ පිළිබඳව ද අවධානය යොමු කර ඔබේ අධ්‍යයනය දිගට ම කරගෙන යන්න.